වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
பிரம்புகள், பித்தளை, மட்பாண்டங்கள், மரப்பொருட்கள் மற்றும் கிராமியக்கைத்தொழில் மேம்பாட்டு இராஜாங்க அமைச்சு
STATE MINISTRY OF RATTAN, BRASS, POTTERY, FURNITURE AND RURAL INDUSTRY PROMOTION

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No | SMRIP/ES/01/06/අභ්‍යන්තර චක්‍රලේඛ | ඔබේ අංකය / எனது இல / Your No | දිනය / திகதி / .02.2021 / Date: 2022.02.18 |

**අමාත්‍යාංශ චක්‍රලේඛ : 05/2022**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් විදාතා නිලධාරීන්,
සියළුම විදාතා සම්පත් මධ්‍යස්ථාන භාර විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් වෙත,

## ග්‍රාමීය කර්මාන්ත කරුවන්ගේ නිෂ්පාදන සඳහා දේශීය හා විදේශීය වෙළඳපළ ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන.

### 01. හැඳින්වීම

රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව, රට හදන සෞභාග්‍යයේ දැක්මට හා තිරසර සංවර්ධන ප්‍රතිපත්ති වලට අනුව ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ලඟා කර ගැනීම වෙනුවෙන් ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යයක් වේ. ඒ අනුව ව්‍යවසායකත්ව වැඩසටහන් තුලින් ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන ඉහළ නැංවීම මෙම වැඩසටහන මඟින් අරමුණු කෙරේ. මෙම සංවර්ධන වැඩසටහන සඳහා රු. මි. 35.00 ක ප්‍රතිපාදන වෙන් කිරීමට වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය කටයුතු කර ඇත. දැනට කර්මාන්තයේ නියැලෙන කර්මාන්තකරුවන් සඳහා මෙම සේවාවන් සැපයීමට සැලසුම් කර ඇත.

### 02. වැඩසටහනේ අරමුණු :

**2.1.** දැනට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් බිහි වී ඇති ගුණාත්මක භාවයෙන් ඉහළ, ග්‍රාමීය කර්මාන්ත කරුවන්ගේ නිෂ්පාදන සඳහා දේශීය හා විදේශීය වෙළඳපල අවස්ථා ලබා දීම.
**2.2.** නිෂ්පාදන භාණ්ඩයන්හි ගුණාංග කාලීන අවශ්‍යතාවයන්ට සුදුසු ලෙස නව්‍යකරණය කිරීම.
**2.3.** ග්‍රාමීය කර්මාන්ත කරුවන්ගේ නිෂ්පාදන භාණ්ඩ සඳහා අගය දාම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### 03. වැඩසටහන් කළමනාකරණය :

ග්‍රාමීය කර්මාන්ත කරුවන්ගේ නිෂ්පාදන අලෙවිකරණ ප්‍රවර්ධනය සඳහා පහත සඳහන් ව්‍යාපෘති සිදු කිරීමට සැලසුම් කර ඇති අතර එම ව්‍යාපෘති සංවිධානය කිරීමේදී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ සහ එක් එක් ව්‍යාපෘතියට අදාළ කාලරාමුව පහත දක්වා ඇත.

Level 07
West Tower
World Trade Centre
Echelon Square

07 වන මහල
බටහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
එචිලන් චතුරශ්‍රය

Tel :+(94) 112 437 805
Tel :+(94) 112 437 828
Fax :+(94) 112 437 823

**3.1. දිස්ත්‍රික් හරිත කඩමණ්ඩි 25ක් පැවැත්වීම :**

- දිස්ත්‍රික්කයේ සෑම විද්‍යා සම්පත් මධ්‍යස්ථානයක්ම සම්බන්ධ කර ගනිමින්, එම නිලධාරීන්ගේද සහය ඇතිව 2022 වර්ෂය සඳහා, දිස්ත්‍රික් විද්‍යා නිලධාරී විසින් දිස්ත්‍රික්කයකට එක් හරිත කඩමණ්ඩියක් සංවිධානය කළ යුතුය.
- මේ සඳහා ජනතාව ආකර්ෂණය වන, සුදුසු කාල වකවානුවක් තෝරා ගත යුතුය.
- හරිත කඩමණ්ඩිය අවම දිනක් පුරා පැවැත්විය යුතුය
- වෙළඳ කුටි සඳහා ගුණාත්මක බවින් යුතු නිෂ්පාදන තෝරා ගත යුතුයි.
- අවම ව්‍යවසායකයන් සංඛ්‍යාව 25 ක් විය යුතුයි.
- දිස්ත්‍රික් විද්‍යා නිලධාරී විසින් **දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය** සහිතව, පහත සඳහන් ( i සිට v දක්වා ) තොරතුරු
    - **i.** දිස්ත්‍රික්කය
    - **ii.** හරිත කඩමණ්ඩිය පැවැත්වීමට යෝජිත දිනය
    - **iii.** ස්ථානය
    - **iv.** ඇස්තමේන්තුව
    - **v.** ප්‍රතිලාභීන් සංඛ්‍යාව

ඇතුලත් වාර්තාවක් ( පිටු අංක **9** හි සඳහන් ඇමුණුම **1** පරිදි) **මාර්තු 15** දිනට ප්‍රථම අමාත්‍යාංශය වෙත **"Estimate : Haritha Kadamandiya – (*District Name*) 2022"** යන මාතෘකාව යටතේ mostrvrc@gmail.com ලිපිනයට යොමු කළ යුතුය.

- වැඩසටහන අවසානයේ දිස්ත්‍රික් විද්‍යා නිලධාරී විසින්
    - **i.** සත්‍ය වියදම
    - **ii.** එක් එක් විද්‍යා සම්පත් මධ්‍යස්ථානයෙන් සහභාගි වූ ව්‍යවසායකයකයන් සංඛ්‍යාව

ඇතුලත් වාර්තාවක් ( පිටු අංක **9** හි සඳහන් ඇමුණුම **2** පරිදි), වැඩසටහන පවත්වා මාසයක් ඇතුලත **" Progress: Haritha Kadamandiya – (*District Name*) 2022 "** මාතෘකාව යටතේ mostrvrc@gmail.com ලිපිනයට එවිය යුතුය.

- **ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කාල රාමුව - හරිත කඩමණ්ඩි 25**

| ක්‍රියාකාරකම | අවසන් කිරීමේ දිනය | ප්‍රතිපාදන ප්‍රමාණය (රු) |
|---|---|---|
| **3.1.1.** ව්‍යාපෘතියට අදාළ උපදෙස් දිස්ත්‍රික් විද්‍යා නිලධාරී හා විද්‍යා හා තාක්ෂණ නිලධාරී වෙත ලබා දීම | පෙබරවාරි **15** දිනට පෙර | මිලියන 2.25 |
| **3.1.2.** ඇස්තමේන්තු සහ හරිත කඩමණ්ඩිය පැවැත්වීමට යෝජිත දින වකවානු ඇතුලත් යෝජනාව අමාත්‍යාංශය වෙත ගෙන්වා ගැනීම | මාර්තු **15** දිනට පෙර | |
| **3.1.3.** ලැබී ඇති අනුමැතිය පරිදි අවශ්‍ය කරන ප්‍රතිපාදන ප්‍රමාණය දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කිරීම. | වැඩසටහන පැවැත්වීමට බලාපොරොත්තු වන කාර්තුවට අදාළව | |
| **3.1.4.** සත්‍ය වියදම සහ සහභාගි වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව සහිත අවසන් වාර්තාවන් අමාත්‍යාංශය වෙත ගෙන්වා ගැනිම. | සැප්තැම්බර් **30** දිනට පෙර | |

**3.2. දිවයිනම ආවරණය වන පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සති පොළවල් 200 ක් පැවැත්වීම :**

- සෑම විද්‍යා සම්පත් මධ්‍යස්ථානයක්ම වසරකට පොළවල් 2 ක් සංවිධානය කළ යුතුය.
- මේ සඳහා විද්‍යා සම්පත් මධ්‍යස්ථාන පරිශ්‍රය තුල හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ජනතාව ආකර්ෂණය වන සුදුසු භූමි පරිශ්‍රයක් තෝරා ගත යුතුය.
- පෙ.ව.10 සිට ප.ව.4 දක්වා සති පොළ පැවැත්විය යුතුය.
- අවම ව්‍යවසායකයන් සංඛ්‍යාව 15 ක් විය යුතුය.
- වෙළඳ කුටි සඳහා ගුණාත්මක බවින් යුතු විවිධ නිෂ්පාදන තෝරා ගත යුතුයි.
- වියදම්,
  - ශාලාව/ පරිශ්‍රය වෙන් කර ගැනීම, කුටි සකස් කිරිම, ආහාර පාන, මුරකරු හා පිරිසිදු කිරීමේ දීමනා සහ ප්‍රවාහන සඳහා වියදම් ගෙවීම සිදු කරනු නොලැබේ.
  - **ප්‍රචාරණ කටයුතු ආදී වෙනත් විශේෂිත වියදමක් තිබේ නම් පමණක් පහත පරිදි ඉල්ලුම් කළ යුතු වේ.**
  - **සති පොළ 2 ම එකම කාර්තුවක් තුල පැවැත්විය යුතු අතර, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන එක වර ඉල්ලුම් කළ යුතු වේ.**
  - විද්‍යා සම්පත් මධ්‍යස්ථාන භාර නිළධාරී විසින් **ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව** පහත සඳහන් ( i සිට vi දක්වා ) තොරතුරු
    - **I.** **විද්‍යා සම්පත් මධ්‍යස්ථානය/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**
    - **II.** **සති පොළ පැවැත්වීමට යෝජිත දින 2**
    - **III.** **ස්ථානය**
    - **IV.** **ඇස්තමේන්තුව**
    - **vi.** **ප්‍රතිලාභීන් සංඛ්‍යාව**

ඇතුලත් වාර්තාවක් ( පිටු අංක **10 හි සඳහන් ඇමුණුම 3** පරිදි) **මාර්තු 30** දිනට ප්‍රථම **" Estimate: Sathi Pola – (*Divisional Secretariat Name*) 2022"** යන මාතෘකාව යටතේ දෘඪ පිටපතක් අමාත්‍යාංශය වෙත එවිය යුතුය.

- සති පොළ පැවැත්වීම සම්බන්ධ ප්‍රගතිය, පිටු අංක **10 හි සඳහන් ඇමුණුම 4** ආකෘතිය පරිදි දිස්ත්‍රික් විද්‍යා නිළධාරී මගින් mostrvrc@gmail.com ලිපිනයට ලබා ගැනිමට කටයුතු කරනු ලැබේ.

- **ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කාල රාමුව**

| ක්‍රියාකාරකම | අවසන් කිරීමේ දිනය | ප්‍රතිපාදන ප්‍රමාණය (රු) |
|---|---|---|
| **3.2.1.** ව්‍යාපෘතියට අදාළ උපදෙස් දිස්ත්‍රික් විද්‍යා නිළධාරී හා විද්‍යා හා තාක්ෂණ නිළධාරී වෙත ලබා දීම | පෙබරවාරි 15 දිනට පෙර | මිලියන 02 |
| **3.2.2.** අවශ්‍ය ඇස්තමේන්තු අමාත්‍යාංශය වෙත ගෙන්වා ගැනීම | මාර්තු 30 දිනට පෙර | |
| **3.2.3.** ලැබී ඇති අනුමැතිය පරිදි අවශ්‍ය කරන ප්‍රතිපාදන ප්‍රමාණය දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කිරීම. | පොළ පැවැත්වීමට බලාපොරොත්තු වන කාර්තුවට පෙර | |
| **3.2.4.** දිස්ත්‍රික් මට්ටමින් අවසන් වාර්තාවන් අමාත්‍යාංශය වෙත ගෙන්වා ගැනිම. | කාර්තුව අවසන් වී ඊගාව මාසයේ මැද වන විට පෙර කාර්තුවට අදාළ ප්‍රගතිය දි.වි.නි. ගෙන් ලබා ගැනීම. | |

**3.3. විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන පරිශ්‍රයේ ස්ථිර වෙළඳ කුටි 5 ක් ගොඩනැගීම :**

- වෙළඳ කුටි ඉදි කිරීමට සුදුසු විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන 5 ක් තෝරා ගැනීම සඳහා, පහත සඳහන් සුදුසුකම් සහිත යෝජනා දිස්ත්‍රික් විද්‍යාතා නිළධාරී විසින් අමාත්‍යාංශය වෙත ගෙන්වා ගැනීම.
    - I. පාරිභෝගිකයන්ට පහසුවෙන් ලඟා විය හැකි, ප්‍රධාන පාරට මුහුණලා පිහිටා ඇති විද්‍යාතා සම්පත් මධ්‍යස්ථානයක් විය යුතුය.
    - II. අමාත්‍යාංශයට අයත් ගොඩනැගිල්ලක් විය යුතුය.
    - III. ස්ථිර මධ්‍යස්ථාන භාර නිළධාරියෙක් සිටිය යුතුය.
    - IV. සාර්ථක ව්‍යවසායක සමිතියක් සහිත විය යුතුය.
    - V. දේශීය හා විදේශීය ව්‍යවසායකයන් ආකර්ෂණය වන ස්ථානයක් විය යුතුය.
- ඒ අතරින් සුදුසු විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන 5 ක් අමාත්‍යාංශය විසින් තෝරා ගැනීම.
- තෝරාගත් විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන භාර නිළධාරී විසින්, ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියෙන් දිස්ත්‍රික් නිළධාරී හරහා වෙළඳ කුටියේ සැළසුම, වියදම් ඇස්තමේන්තුව සහ තාක්ෂණ නිළධාරීගේ වාර්තාව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුයි.
- වෙළඳ කුටියට අදාළ විධිමත් ගිවිසුමක් අත්සන් කර අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත යුතුය.

- **ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කාල රාමුව**

| ක්‍රියාකාරකම | අවසන් කිරීමේ දිනය | ප්‍රතිපාදන ප්‍රමාණය (රු) |
|---|---|---|
| **3.3.1.** ව්‍යාපෘතියට අදාළ උපදෙස් දිස්ත්‍රික් විද්‍යාතා නිළධාරී හා විද්‍යා හා තාක්ෂණ නිළධාරී වෙත ලබා දීම | පෙබරවාරි **28** දිනට පෙර | |
| **3.3.2.** සුදුසු යෝජනා දිස්ත්‍රික් විද්‍යාතා නිළධාරී මගින් අමාත්‍යාංශය වෙත ගෙන්වා ගැනීම සහ සුදුසු විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන 5ක් තෝරා ගැනීම. | මාර්තු **31** දිනට පෙර | |
| **3.3.3.** තෝරා ගත් විද්‍යාතා සම්පත් මධ්‍යස්ථාන 5 හි විද්‍යා හා තාක්ෂණ නිළධාරීන් මගින් අමාත්‍යාංශය වෙත වෙළඳ කුටියේ සැළසුම, වියදම් ඇස්තමේන්තුව සහ තාක්ෂණ නිළධාරීගේ වාර්තාව ගෙන්වා ගැනීම | අප්‍රේල් **30** දිනට පෙර | මිලියන 15 |
| **3.3.4.** අනුමැතිය පරිදි අවශ්‍ය කරන ප්‍රතිපාදන ප්‍රමාණය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත නිදහස් කිරීම. | මැයි **15** දිනට ප්‍රථම | |
| **3.3.5.** වෙළඳ කුටියේ කටයුතු අවසන් කිරීමෙන් පසුව සත්‍ය වියදම් වාර්තාව අමාත්‍යාංශය වෙත ගෙන්වා ගැනීම. | ජුනි **30** දිනට ප්‍රථම | |
| **3.3.6.** වෙළඳ කුටියට අදාළ විධිමත් විධිමත් ගිවිසුමක් සකස් කර අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම. | ජුලි **15** දිනට ප්‍රථම | |

**3.4. ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ අලෙවිකරණ කුසලතා වැඩි දියුණු කිරීමට විදාතා සම්පත් මධ්‍යස්ථාන භාර නිළධාරීන් 100ක් පුහුණුකරුවන් වශයෙන් පුහුණු කිරීමේ වැඩසටහන:**

- පුහුණුව සඳහා අළුතින් බඳවා ගත් සංවර්ධන නිළධාරීන් 25 ට සහ තවත් විදාතා සම්පත් මධ්‍යස්ථාන භාර නිළධාරීන් 75 දෙනෙකු සඳහා අවස්ථාව සළසනු ලැබේ.

- **ව්‍යාපෘතියේ ක්‍රියාත්මක පියවර සහ කාල රාමුව**

| ක්‍රියාකාරකම | අවසන් කිරීමේ දිනය | ප්‍රතිපාදන ප්‍රමාණය (රු) |
|---|---|---|
| **3.4.1.** පුහුණු වැඩසටහන් අමාත්‍යාංශය මගින් සංවිධානය කිරීම | මාර්තු 30 දිනට පෙර | මිලියන 1.5 |
| **3.4.2.** නිළධාරීන් කණ්ඩායම් කර පුහුණුව සඳහා කැඳවීම | මැයි 30 දිනට පෙර | |

**3.5. ග්‍රාමීය නිපැයුම් අපනයන අගය දාම සංවර්ධන වැඩසටහන් 25 ක් දිස්ත්‍රික් මට්ටමින් සංවිධානය කිරීම:**

- දිස්ත්‍රික්කයේ අපනයන කරුවන් අතර සම්බන්ධතාවය ගොඩනැගීම සහ අපනයන කරුවන් සහ ග්‍රාමීය කර්මාන්ත කරුවන් අතර සම්බන්ධතාවය ගොඩනැගිම හරහා දේශීය නිෂ්පාදන සඳහා අපනයන අවස්ථා වැඩිදියුණු කිරීම මෙම වැඩසටහනේ අරමුණයි.

- අගය දාම සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ.

1. සුදුසු පරිසරයක් සහිත ස්ථානයක් තෝරා ගැනීම.
2. අවම වශයෙන් අපනයන කරුවන් සහ ව්‍යවසායකයන් 50 දෙනෙකුවත් සහභාගි කරවීම.
3. දිස්ත්‍රික් විදාතා නිළධාරි විසින් පහත සඳහන් තොරතුරු ඇතුලත් වාර්තාවක් දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශයෙන් **පෙබරවාරි 28** දිනට ප්‍රථම **පිටු අංක 11 හි සඳහන් ඇමුනුම 5** ට අනුකූලව, mostrvrc@gmail.com විද්‍යුත් ලිපිනයට "**Estimate: Vidatha Export Chain– (*District Name*) 2022**" යන මාතෘකාව යටතේ ඉදිරිපත් කළ යුතුය.
   I. **දිස්ත්‍රික්කය**
   II. **විදාතා අපනයන සංසදය පැවැත්වීමට යෝජිත දිනය,**
   III. **ස්ථානය**
   IV. **ඇස්තමේන්තුව (රු.200,000.00 ක උපරිමයකට යටත්ව)**
   V. **ප්‍රතිලාභී නාම ලේඛණය**
4. දිස්ත්‍රික්කයේ අපනයන කරුවන් සහ සුදුසු කර්මාන්ත කරුවන්ට අමතරව අදාළ රාජ්‍ය ආයතන ප්‍රධානීන්ද කැඳවීම.
5. සංසදය අවස්ථාවේදී ග්‍රාමීය කර්මාන්ත කරුවන්ගේ මෙන්ම අපනයන කරුවන්ගේද නිෂ්පාදන ප්‍රදර්ශණය කිරිමට අවස්ථාව සැළසිම.
6. දිස්ත්‍රික්කයේ සිටින ප්‍රසිද්ධ අපනයන කරු ඔහුගේ අත්දැකීම් අනෙකුත් කර්මාන්ත කරුවන් සමග හුවමාරු කර ගැනීම.
7. සහභාගි වන අපනයන කරුවන්ගේ සහ ග්‍රාමිය කර්මාන්ත කරුවන්ගේ තොරතුරු (උදා:- නිෂ්පාදනය, නම, දුරකථනය, ලිපිනය) එකිනෙකා අතර හුවමාරු කිරිමට ක්‍රමවේදයක් යෙදිම
8. සංසදය පවත්වා මාසයක් ඇතුලත සංසදය හරහා ගොඩනැගුණු ව්‍යවසායක සම්බන්ධතා පිළිබඳ වාර්තාවක් **පිටු අංක 11 හි සඳහන් ඇමුණුම 6** ආකෘතියට අනුව, අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.
9. එමෙන්ම අපනයන මට්ටමට ගෙන ඒම සඳහා තවදුරටත් වැඩිදියුණු කළ යුතු නිෂ්පාදන පිළිබඳව තොරතුරු **පිටු අංක 11 හි සඳහන් ඇමුණුම 7** ආකෘතිය අනුව අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.
10. වැඩසටහන පැවැත්වීමෙන් අනතුරුව මාස 3න් 3ට මාස 6ක් දක්වා **පිටු අංක 12 හි සඳහන් ඇමුණුම 8** ආකෘතිය අනුව, අමාත්‍යාංශය වෙත ප්‍රගතිය ඉදිරිපත් කළ යුතුය.
11. එක් වැඩසටහනක් සංවිධානය කිරිම සඳහා රු.200,000.00 ක උපරිමයකට යටත්ව ප්‍රතිපාදන ඉල්ලුම් කළ හැකිය.

➢ ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කාල රාමුව

| | ක්‍රියාකාරකම | අවසන් කිරීමේ දිනය | ප්‍රතිපාදන ප්‍රමාණය (රු) |
|---|---|---|---|
| අනු ක්‍රියාකාරකම | **3.5.1.** ව්‍යාපෘතියට අදාළ උපදෙස් දිස්ත්‍රික් විදාතා නිළධාරී හා විද්‍යා හා තාක්ෂණ නිළධාරී වෙත ලබා දීම | පෙබරවාරි **18** දින වන විට | මිලියන 10 |
| | **3.5.2.** දිස්ත්‍රික් විදාතා නිළධාරී විසින් දිස්ත්‍රික්කයේ සහ ආසන්න දිස්ත්‍රික්ක වල සිටින අපනයන කරුවන් සහ ඔවුන්ගේ වෙළඳ අවශ්‍යතා හඳුනාගැනීම ( උදා:- අවශ්‍ය අමුද්‍රව්‍ය හෝ නිෂ්පාදන/ අවශ්‍ය කරන ප්‍රමාණය) | පෙබරවාරි 28 දිනට පෙර | |
| | **3.5.3. අපනයන කරුවන්ගෙන් ලබා ගන්නා ලද ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳ** තොරතුරු දිස්ත්‍රික් විදාතා නිළධාරී විසින් විද්‍යා හා තාක්ෂණ නිළධාරී වෙත දැනුම් දීම | | |
| | **3.5.4.** විද්‍යා හා තාක්ෂණ නිළධාරී විසින් ඉහත ඉල්ලුමට සරිලන සැපයුම් ලබා දිය හැකි ග්‍රාමීය කර්මාන්ත කරුවන් හඳුනාගැනීම. | | |
| | **3.5.5.** දිස්ත්‍රික් මට්ටමින් ග්‍රාමීය නිපැයුම් අපනයන අගය දාම සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීමට අදාළ ඇස්තමේන්තු සහ දින වකවානු ඇතුලත් යෝජනාව අමාත්‍යාංශය වෙත ගෙන්වා ගැනීම. | | |
| | **3.5.6.** ලැබී ඇති අනුමැතිය පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන නිදහස් කිරීම. | මාර්තු 20 දින වන විට | |
| | **3.5.6.** වැඩසටහන පවත්වා මාසයක් ඇතුලත වැඩසටහනේ සත්‍ය වියදම සහ අපනයන කරුවන් සමග සම්බන්ධ කරන ලද ග්‍රාමීය කර්මාන්ත කරුවන්ගේ තොරතුරු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරිම. | ජුනි 30 වන විට | |
| | **3.5.7.** ඉන් අනතුරුව අපනයන කරුවන් සහ ව්‍යවසායකයන් අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරිම. | ජුලි 31 වන විට | |
| | **3.5.8.** මෙම වැඩසටහනෙන් හඳුනාගන්නා ග්‍රාමීය කර්මාන්ත කරුවන්ගේ නිෂ්පාදන අපනයන මට්ටමට ගෙන ඒම සඳහා විශේෂ අවශ්‍යතා තිබේ නම් එම අවශ්‍යතා දිස්ත්‍රික් විදාතා නිළධාරී විසින් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරිම. | ජුනි 30 වන විට | |
| | **3.5.9. එම අවශ්‍යතා සපුරාලීම සඳහා** අමාත්‍යාංශය විසින් අදාළ ආයතන වෙත යොමු කිරීම. | අගෝස්තු 31 වන විට | |
| | **3.5.10.** අදාළ අවශ්‍යතා සපුරාලීමෙන් අනතුරුව අපනයන කරුවන් සහ ව්‍යවසායකයන් අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරිම. | සැප්තැම්බර් 30 වන විට | |
| | **3.5.11.** පසු විපරම් කිරීම (දිස්ත්‍රික් විදාතා නිළධාරී හා විද්‍යා හා තාක්ෂණ නිළධාරී විසින්) | දෙසැම්බර් 31 දක්වා | |

## 5. පැහැදිලි කර ගැනීම

මෙම චක්‍රලේඛය පිලිබඳ කිසියම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වන්නේ නම් අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (විදාතා), ජයසමරා ගුණරත්න මෙනෙවිය, දුරකථන අංක 011-2331356 ඔස්සේ විමසන ලෙස කාරුණිකව දන්වමි.

**එම්.ඒ.බී.වී. බණ්ඩාරනායක**
ලේකම්
වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

**පිටපත් :**

01. ජනාධිපති ලේකම්
02. අග්‍රාමාත්‍ය ලේකම්
03. ලේකම්, මුදල් අමාත්‍යාංශය
04. ලේකම්, කර්මාන්ත අමාත්‍යාංශය
05. ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
06. ලේකම්, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය
07. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තුමේන්තුව
08. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තුමේන්තුව
09. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
10. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව

Annexure: 1

## Estimate - Haritha Kadamandiya : 2022

| District | Proposed Date | Estimate (Rs) | No. of Entrepreneurs to be Participated |
|---|---|---|---|
| | | Item 1 - | |
| | | Item 2 - | |
| | | Item 3 - | |
| | | Total (Rs) | |

Annexure: 2

## Progress - Haritha Kadamandiya 2022

**Distrct : ……………………………………**

**Allocation Received : Rs ………………………………..**

**Actual Expenditure : Rs …………………………………..**

**Date Conducted Haritha Kadamandiya : …………………………..**

**Place : ………………………………………………………..**

| # | VRC | No. of Entrepreneurs Participated | Average Turn Over (Rs.) |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| | Total No. Participated | | |

Annexure: 3

## Estimate: Sathi Pola - (*Divisional Secretariat Name*) 2022

| VRC | Proposed Date | Estimate (Rs) | No. of Entrepreneurs to be Participated |
|---|---|---|---|
| | 1 | Item 1 - | 1 |
| | 2 | Item 2 - | 2 |
| | | Item 3 - | |
| | | Total (Rs) | |

Annexure: 4

## Progress – Weekly Fairs 2022

**District : ......................**

| | VRC | No. of Fairs Conducted & Number of Beneficiaries Participated | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1st Quarter | | | | | | Actual Expenditure (Rs.) | 2nd Quarter | | | | | | Actual Expenditure (Rs.) | 3rd Quarter | | | | | | Actual Expenditure (Rs.) | 4th Quarter | | | | | | Actual Expenditure (Rs.) |
| | | Jan | | Feb | | Mar | | | April | | May | | June | | | July | | Augu st | | Sep | | | Oct | | Nov | | Dec | | |
| | | Fairs | Beneficiaries | Fairs | Beneficiarie | Fairs | Beneficiarie | | Fairs | Beneficiaries | Fairs | Beneficiaries | Fairs | Beneficiaries | | Fairs | Beneficiarie | Fairs | Beneficiarie | Fairs | Beneficiarie | | Fairs | Beneficiaries | Fairs | Beneficiaries | Fairs | Beneficiaries | |
| 1 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| 2 | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |

**Annexure: 5**

## Estimate - Vidatha Export Chain: (*District Name*) 2022

| District | Proposed Date/ Dates | Estimate (Rs) | No. of Beneficiaries to be Participated |
|---|---|---|---|
| | | Item 1 - | |
| | | Item 2 - | |
| | | Item 3 - | |
| | | Total (Rs) | |

**(List of Exporters & List of Rural Industrialists also Should be attached according to the following formats)**

| District | # | VRC | Product | Rural Industrialist (Name, Address, Telephone) |
|---|---|---|---|---|
| | 1 | | | |
| | 2 | | | |

| District | # | Product | Export Entrepreneur (Name, Address, Telephone) |
|---|---|---|---|
| | 1 | | |
| | 2 | | |

**Annexure: 6**

## Exporters and Rural Industrialists Co-ordinated Through Program

**District :.........................**

**Actual Expenditure :...............................**

**Date Conducted the Program :............................**

**Place : ..............................................**

| # | VRC | Product | Export Entrepreneur (Name, Address, Telephone) | Export Entrepreneur/ Rural Industrialist (Name, Address, Telephone) | Link formed between Exporter & Rural Industrialist or between 2 Exporters |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

Annexure: 7

## Support Needed By Rural Industrialist

**District: ........................**

| # | VRC | Rural Industrialist (Name, Address, Telephone) | Product | Support Needed from the Ministry |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |

(Pls. clearly mention the support needed from Ministry)

Annexure: 8

## Progress - Exporters and Rural Industrialists Co-ordinated Through the Forum

**District: ........................**

| # | VRC | Product | Rural Industrialist (Name, Address, Telephone) | Export Entrepreneur (Name, Address, Telephone) | Whether the link Maintained According to the Agreement (Yes/No) | |
|---|---|---|---|---|---|---|
| | | | | | In 1st 3 Months | In 2nd 3 Months |
| | | | | | | |
| | | | | | | |